# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120 / 2171635

ෆැක්ස් / தொலைநகல / Fax – 011-

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1738 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 21/11/2024 පැය 1520

# මාධ්‍ය නිවේදනය

## 01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය කටුනායක ගුවන්තොටුපල ඒකකය.

2024.11.20 වන දින උදෑසන කාලයේ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශයේ කටුනායක උප ඒකකයේ නිලධාරීන් හා රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකයේ නිලධාරීන් සමඟ එක්ව කටුනායක ගුවන්තොටුපොල පරිශ්‍රයේ භාණ්ඩ නිශ්කාශනය කරන ස්ථානයේ වැටලීමක් සිදුකර පකිස්ථානයේ කරච්චි සිට මෙරටට රැගෙන එන ලද **හෙරොයින් ග්‍රෑම් 309 ක් සන්තකයේ** තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50ක් වන පොල්ගස්ඕවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශ කටුනායක උප ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.11.20 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ වෙහෙරගොඩැල්ල ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මාලිගාවත්ත පොලිස් ස්ථානය.**

2024.11.20 වන දින රාත්‍රී කාලයේ මාලිගාවත්ත පොලිස් වසමේ බෝධිරාජ මාවත ප්‍රදේශයේදී මාලිගාවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීම් දෙකක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800 ක්** හා **හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23 හා 37 වයස් වල පසුවන බලංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මාලිගාවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**